**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 15/2009 (සංශෝධන III)**

මගේ අංකය - විවැ/චක්‍රලේඛ/2018,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10,
2018.11.09

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් ,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම**

ඉහත කරුණ සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද 2009.08.21 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009, 2011.05.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන I) හා 2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) ට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) හි 01 මඟින් දක්වා ඇති කරුණු , අංක 2084/59 හා 2018 අගෝස්තු මස 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සංශෝධනය කරමි.

01. (අ) 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන් පසුව විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ දී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අය කළ යුතුය.

(ආ) 2012 මාර්තු මස 19 දිනට පෙර නැවත සේවයේ යොදවාගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී කලින් ඔවුන් වෙත කරන ලද ප්‍රදානය අනුව ගෙවන ලද පාරිතෝෂිකයෙන් අදාළ දිනය දක්වා අය කරන ලද පාරිතෝෂිකයේ වටිනාකම හැර ඉතිරි පාරිතෝෂිකයේ වටිනාකම සංශෝධනයෙන් පසු හිමි පාරිතෝෂිකයෙන් අඩුකර අවශ්‍ය ගැලපීම් සිදු කර ආපසු ගෙවිය යුතු මුදලක් වෙත් නම් ගෙවීම් කල යුතුය.

02. විශ්‍රාමික රජයේ නිළධරයන් නැවත සේවයේ යෙදවීම පිලිබඳව 2018.02.20 දින නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 චක්‍රලේඛය මගින්, ඊට පෙර නිකුත් කල 2007.05.11 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛය සහ එයට අදාල සංශෝධන ඇතුලත් චක්‍රලේඛ අවලංගු කර ඇත. එබැවින් 03/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන 2018.02.01 දින සිට බලාත්මක වේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ. සඳහා
3. ලේකම් - රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
4. ලේකම් - මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
5. විගණකාධිපති - කරු. දැ.ගැ. සඳහා